**පාතහේවාහැට ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**
**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 19 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | ------------- | -------------------------------- |
| (අ) | රු.863,024 ක් වූ ගබඩා ද්‍රව්‍ය නිකුත් කිරීම් දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |
| (ආ) | ඉකුත් වර්ෂයේ අඩුවෙන් හඳුනා ගත් එකතුව රු.212,751 ක් වූ ණයගැති හා ණයහිමි ශේෂ සමාලෝචිත වර්ෂයේ ගනුදෙනුවක් ලෙස තුළ ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

#### 1.3.2 නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | -------------------------------- |
| මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 05 ක ශේෂ හා උපයෝගී ලේඛන අතර රු.782,849 ක නොසැසඳීමක් විය. | වෙනස්කම් හඳුනා ගෙන නිවැරදි කිරීම් කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී අදාළ නොසැසඳීම් නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

#### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | -------------- | ---------------------------- |
| (අ) | <u>ලැබිය යුතු ගිණුම්</u><br>අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.498,035 ක් හා අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හි එකතුව රු.1,608,326 ක් විය. | ලැබිය යුතු මුදල් අය කර ගත යුතුවේ. | ඉදිරියේ දී අදාළ ආයතන හා පුද්ගලයින් දැනුවත් කර, අය කරමි. |

(ආ) <u>ගෙවිය යුතු ගිණුම්</u>

| | | |
|---|---|---|
| අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් තුළ ගෙවිය යුතු ගිණුම් ශේෂයන් හි එකතුව රු.376,905 ක් විය. | ගෙවීම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී අදාළ මුදල් ගෙවා නිරවුල් කරමි. |

**1.3.4 <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම තොරතුරු ඉදිරිපත් නොකිරීම</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.18,640,902 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් සඳහා ඔප්පු, පැවරුම් නියෝග, ලිපිගොනු හා උපයෝගී ලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරුන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන දන්වා ඇත. |

**1.3.5 <u>අනුකූල නොවීම</u>**

**1.3.5.1 <u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>**

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | | | |
| | 218 රීතිය | ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් පරීක්ෂා කර නොතිබුණි. | අදාළ රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ සමීක්ෂණයක් සිදු කර වාර්තා පිළියෙල කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | මු.රෙ.571 | කාලය ඉක්ම වූ ව්‍යාපෘති 16 කට අදාළ රු.213,548 ක් වූ තැන්පත් ආදායමට බැර කිරීම හෝ ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුඅවේ. | රජයේ ආදායමට බැර කිරීමට ඉදිරියේ දි කටයුතු කරමි. |
| (ඇ) | 2016 මාර්තු 17 දිනැති මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක 2016/03 චක්‍රලේඛයේ 06 වගන්තිය | දෙල්තොට පොදු වෙළඳ පොල කඩ කාමර 46 ක් සඳහා නව තක්සේරුව මත ගිවිසුම්ගත වී නොතිබුණි. | අදාළ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නව තක්සේරුව මත ඉදිරියේ දී ගිවිසුම්ගත වීමට කටයුතු කරමි. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.29,451,639 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.32,598,203 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,445,247 | 2,227,999 | 2,523,912 | 6,405,182 | 2,457,319 | 2,257,124 | 2,248,475 | 6,484,677 |
| (ii) | කුලී | 7,573,083 | 4,860,666 | 4,672,308 | 1,185,400 | 4,102,089 | 3,441,900 | 3,733,878 | 702,776 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,357,500 | 1,487,010 | 1,487,010 | -- | 4,131,325 | 2,907,999 | 2,577,599 | 2,369,700 |
| (iv) | වෙනත් ආදායම් | 64,744,379 | 52,188,729 | 48,450,230 | 100,771,385 | 36,927,188 | 41,463,018 | 13,904,751 | 84,234,185 |
| | එකතුව | 78,120,209 | 60,764,404 | 57,133,460 | 108,361,967 | 47,617,921 | 50,070,041 | 22,464,703 | 93,791,338 |

#### 2.2.2 <u>වරිපනම් හා බදු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අක්කර බදු | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.1,308,243 ක් අය කර නොතිබුණි. | හිඟ මුදල් අය කළ යුතුවේ. | සමීක්ෂණයක් සිදු කර අක්කර බදු ලේඛනය යාවත්කාලීන කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |
| (ආ) ජල බදු | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.14,135,496 ක් අය කර නොතිබුණි. | හිඟ මුදල් අය කළ යුතුවේ. | 2019 වර්ෂයේ දී ජංගම සේවා හා සැපයුම් විසන්ධි කිරීම මඟින් ගාස්තු අය කළ අතර, ඉදිරියේ දී හිඟ ගාස්තු අය කරමි. |

#### 2.2.3 <u>කුලී</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගලහා පොදු වෙළඳ පොල කඩය මඟින් අය විය යුතු රු.219,240 ක කුලිය අය කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවසර ලැබී ඇති බැවින්, ඉදිරියේ දී ඒ සඳහා කටයුතු කරමි. |

**2.2.4** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.2,126,449 ක් හා මුද්දර ගාස්තු රු.49,948,502 ක් විය. | ලැබිය යුතු මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී ලේඛන සකස් කර මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |

**3.** <u>**මෙහෙයුම් සමාලෝචනය**</u>

**3.1** <u>**කාර්යසාධනය**</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට වැය විෂයයන් 05 ක් සඳහා වෙන් කරන ලද රු.5,405,000 ක් උපයෝජනය කර නොතිබුණි. | ප්‍රතිපාදන අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් බල ප්‍රදේශයේ මහජනතාව වෙනුවෙන් විවිධ වූ කාර්යයන් ක්‍රියාත්මක කරන නමුත්, ඒවා තිරසර සංවර්ධන ඉලක්ක සමඟ කෙසේ ගැළපේ ද, යන්න පිළිබඳ ඇගයීමක් හා පසු විපරම් ක්‍රියාවලියක් සිදු කර නොතිබුණි. | පසු විපරම් ක්‍රියාවලියක් සිදු කළ යුතු වේ. | 2020 වර්ෂයේ දී ඉලක්කගත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. |

**3.2** <u>**මානව සම්පත් කළමනාකරණය**</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත කාර්ය මණ්ඩලය තුළ පුරප්පාඩු 17 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුවේ. | බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින්, පුරප්පාඩු තවදුරටත් පවතී. |

## 3.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | දේපළ බදු දීම සම්බන්ධ අඩුපාඩු | | |
| (අ) | විධිමත් බදු ගිවිසුමකින් තොරව කඩ කාමර 16 ක් බදු දී තිබුණි. | බදු ගිවිසුම් අත්සන් කළ යුතුවේ. | බදු ගිවිසුම් සැකසීමට අවශ්‍ය කටයුතු ඉදිරියේ දී සිදු කරමි. |
| (ආ) | ගලහා සහ තලාතුඔය යන ප්‍රදේශවල පිහිටි කඩ කාමර 28 ක් 2008 වර්ෂයෙන් පසු තක්සේරු කර නොතිබුණි. | නව තක්සේරුවක් ලබා ගත යුතුවේ. | තක්සේරු කිරීම් සඳහා නිලධාරීන් පැමිණ දත්ත ලබා ගත් අතර, තක්සේරු වාර්තා මේ වන විට ද ලැබී නොමැත. |

## 3.4 <u>වත්කම් කළමනාකරණය</u>

### 3.4.1 <u>වත්කම් ලේඛන ගත නොකිරීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රජාශාලා 13 ක්, සුසාන භූමි 64 ක් හා පොදු වැසිකිළි 05 ක අයිතිය, වටිනාකම සහ ප්‍රමාණය තහවුරු කර ගනිමින් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනගත කළ යුතුවේ. | ඉදිරියේ දී අයිතිය වටිනාකම හා ප්‍රමාණය තහවුරු කර ගෙන ලේඛනගත කරමි. |

### 3.4.2 <u>වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉඩම් හා ගොඩනැගිලි ඒකක 22 ක නිවැරදි අයිතිය තහවුරු කර ගෙන නොතිබුණි. | වත්කම්වල අයිතිය තහවුරු කර ගත යුතුවේ. | පිඹුරු හා ඔප්පු සකස් කිරීමට අදාළ මූලික කටයුතු සිදු කර ඇති බව දන්වමි. |
| (ආ) | පානීය ජල යෝජනා ක්‍රම 07 ක අයිතිය හා වටිනාකම නිවැරදිව තහවුරු කර ගෙන නොතිබුණි. | වත්කම්වල අයිතිය තහවුරු කර ගත යුතුවේ. | ඉදිරියේ දී අයිතිය තහවුරු කර ගෙන වටිනාකම හඳුනා ගැනීමට කටයුතු කරමි. |

### 3.4.3 <u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.627,819 ක් වටිනා ස්ථාවර වත්කම් අයිතම 13 ක් නිෂ්ක්‍රීයව පැවතුණි. | වත්කම්වලින් උපරිම ප්‍රයෝජන ගත යුතුවේ. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට හෝ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කර ඇත. |

**3.5 වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2015 වර්ෂයේ පරිත්‍යාග ලෙස ලද රු.17,649,179 ක වටිනාකමක් සහිත ෆෝටෝන් ලෝවල් බැකෝ යන්ත්‍රය පැය 93 ක් පමණක් ධාවනය කර තිබූ නමුත්, නඩත්තු කටයුතු වෙනුවෙන් රු.905,451 ක් වැය කර තිබුණි. | වත්කම්වලින් උපරිම ප්‍රයෝජන ගත යුතුවේ. | බැකෝ යන්ත්‍රය මඟින් දැනට ආදායම් උත්පාදනය කරමි. |

**3.6 ආර්ථික නොවූ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු බැකෝ යන්ත්‍රය නිෂ්කාර්යව තිබිය දී, බැකෝ යන්ත්‍රයක් කුලියට ලබා ගැනීම සඳහා යන්ත්‍ර පැයකට රු.2,700 බැගින් රු.217,080 ක් ගෙවා තිබුණි. | අවශ්‍යතාවය මත පමණක් සේවා ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

**3.7 ප්‍රසම්පාදනය**

**3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂය තුළ රු.25,230,941 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කරමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 නොවිසඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොලත් විගණන විමසුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2018 - 3.2(අ)<br>සභාව ක්‍රියාත්මක කරනු ලබන උඩුවෙල, මුරපොල හා කොළඹිස්ස ජල ව්‍යාපෘතිවල ජල මනු 280 ක් අක්‍රීය වී තිබූ නිසා, නිවැරදි ජල ගාස්තු අය කර ගැනීමට නොහැකි වී තිබුණි. | ජල ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුවේ. | පෙරහන් ටැංකි ඉදිකර ඉදිරියේ දී ජල මනු සවි කිරීමට කටයුතු කරමි. |
| (ආ) 2018 - 3.3(ආ)<br>මහනුවර මහා නගර සභාවට ස්ථාන මාරු වී ගිය නිලධාරිනියකගේ අය විය යුතු රු.160,854 ක ණය ශේෂය අය කර නොතිබුණි. | ණය ශේෂ අය කිරීමට කටයුතු කළ යුතුවේ. | අය කර ගැනීම සම්බන්ධයෙන් අදාළ ආයතන දැනුවත් කර ඇත. |

(ඇ) 2018 - 3.4(ඈ)

------------------

| | | |
|---|---|---|
| 1994 – 2012 කාල පරිච්ඡේදය තුළ බදු දුන් කඩ කාමර 64 ක බදු ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | බදු ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී බදු ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කරමි. |

(ඈ) 2018 - 3.5.2(අ)

-------------------

| | | |
|---|---|---|
| සභාව සතු ජල යෝජනා ක්‍රම 08 ක පාරිභෝගික ඒකක 2547 කින් මනු රහිතව ස්ථාවර ජල ගාස්තුවක් පමණක් අය කර තිබුණි. | මනු සවි කර නිවැරදි ජල ගාස්තු අය කළ යුතුවේ. | ඉදිරියේ දී පෙරහන් ටැංකි හා ජල මනු ලබා ගෙන ගාස්තු අය කරමි. |

(ඉ) 2018 - 3.5.3

----------------

| | | |
|---|---|---|
| සභාව විසින් කට්ටි කරන ලද ඉඩම් 06 කින් ලබා ගත් ඉඩම් කොටස් සඳහා අදාළ ඔප්පු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඔප්පු ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී පිඹුරු හා ඔප්පු සකස් කිරීමට කටයුතු කරමි. |

(ඊ) 2018 - 3.5.4(ඇ)

-------------------

| | | |
|---|---|---|
| සභාවේ තොග ලේඛන නියැදියක් පරීක්ෂා කිරීමේ දී, වසර 03 ත් 05 ත් අතර කාලයක් තුළ නිකුත් කර නොතිබූ, රු.200,029 ක් වටිනා ජලනළ උපාංග ඒකක 336 ක් නිෂ්ක්‍රීයව පැවතුණි. | වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉතිරි භාණ්ඩ සමීක්ෂණ වාර්තා මත විකුණා දැමීමට කටයුතු කරමි. |